## හානිය අවම කිරීමට නම්,

- පොලිතීන් හා ප්ලාස්ටික් අනෙකුත් අපද්‍රව්‍ය වලින් වෙන් කරන්න.
- කිසි විටෙකත් ප්ලාස්ටික්, පොලිතීන් දහනය නොකරන්න.
- නැවත භාවිතා කල හැකි හා නැවත පිරවිය හැකි නිෂ්පාදන මිලට ගන්න. (වීදුරු, ලෝහ, මැටි)
- ලන්ච්ෂීට් භාවිතයෙන් ඉවත්වී කෑම පෙට්ටි භාවිතා කරන්න.
- ඔබ විශ්වවිද්‍යාල ආපන ශාලාවෙන් ආහාර ලබාගන්නා අයෙක් නම් කෑම පෙට්ටියක් රැගෙන විත් එයට ආහාර ලබා ගන්න.
- ප්ලාස්ටික් ඇසුරුම් වෙනුවට පරිසර හිතකාමී විකල්ප ද්‍රව්‍ය භාවිතා කරන්න.

  පන්වලින් සාදන ලද මලු
  බට පතුරුවලින් සාදන ලද ඇසුරුම්
  පොල්, තල් ආදී ශාක පත්‍රවලින් තනා ගන්නා මලු
  කඩදාසි දවටන
  රෙදි මලු
  නෙලුම්, කැන්ද ,කෙසෙල් ආදී ශාක පත්‍ර
- සෑමවිටම 3R සංකල්පය ක්‍රියාත්මක කරන්න.

1. භාවිතය අඩු කිරීම (Reduce)
2. නැවත භාවිතය (Reuse)
3. ප්‍රතිචක්‍රීකරණය (Recycle)

***Centre for Environmental Studies and Sustainable Development (CESSD)***
The Open University Sri Lanka
P.O.Box 21, Nawala, Nugegoda, Sri Lanka.
Phone : (94) 112881423
E-mail : cessd@ou.ac.lk
Facebook: The Centre for Environmental Studies and Sustainable Development- (CESSD)

## ප්ලාස්ටික් වර්ග

| | Polythene terephthalate (PETE/PET) | High density polyethylene (HDPE) | Polyvinyl chloride (PVC) | Low density polyethylene (LDPE) | Polypropylene (PP) | Polystyrene (PS) | Other plastics including acrylic, fiberglass, nylon, polycarbonate (OTHER) |
|---|---|---|---|---|---|---|---|
| හදුනා ගැනීමේ කේතය | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| භාවිතය | සිසිල් බීම බෝතල් ,වතුර බෝතල් ,මාජරීන් බඳුන් | නැවුම් කිරි බෝතල්,පවිත්‍ර කාරක ද්‍රාවණ බෝතල්,ෂැම්පු බෝතල්, මල් පෝච්චි | ජල නල , පිඟු ආහාර බහලුම් | 'සිලි සිලි' මලු, පාන් බනිස් වැනි බේකරි ආහාර දවටන, ලන්ච්ෂීට් | ප්ලාස්ටික් බඳුන් , නැවත භාවිත කල හැකි වතුර බෝතල්, සෙල්ලම් බඩු | ඉවතලන කෝප්ප , යෝගට් කෝප්ප, ආහාර ඇසුරුම් පෙට්ටි | CD, DVD, ඇස් කණ්නාඩි, වැඩි ධාරිතාවක් ඇති වතුර බෝතල් |
| ප්‍රතිචක්‍රීකරණ හැකියාව | ප්‍රතිචක්‍රීකරණය පහසුයි | ප්‍රතිචක්‍රීකරණය පහසුයි | ප්‍රතිචක්‍රීකරණය අපහසුයි | ප්‍රතිචක්‍රීකරණය කළ හැක. | ප්‍රතිචක්‍රීකරණය පහසුයි | ප්‍රතිචක්‍රීකරණය අපහසුයි | ප්‍රතිචක්‍රීකරණය අපහසුයි |
| වියෝජනයට ගතවන කාලය | වර්ෂ 5-10 | වර්ෂ 100 | වර්ෂ 450 | වර්ෂ 500-1000 | වර්ෂ 20-30 | වර්ෂ 50 | බහුතරයක් වියෝජනය නොවේ. |

# ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

# Plastic Free OUSL

### හරිත විශ්වවිද්‍යාල ව්‍යාපෘතිය

### පාරිසරික අධ්‍යන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය



## දැක්ම

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ වර්තමාන හා අනාගත සිසුන්ගේ අධ්‍යාපනික සහ අනෙකුත් කටයුතුවලට හිතකාමී වන තිරසාර පරිසරයක් නිර්මාණය කිරීම හා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය හරිත විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීම.

## ක්‍රමවේදය

1. විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළට පොලිතීන් හා ප්ලාස්ටික් රැගෙන ඒම තහනම් කිරීම.
2. පොලිතීන් හා ප්ලාස්ටික් සඳහා විකල්ප හඳුන්වා දීම.
3. පොලිතීන් හා ප්ලාස්ටික් මඟින් පරිසරයට හා සෞඛ්‍යට සිදුවන බලපෑම පිළිබඳව දැනුවත් කිරීම.
4. පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය හා නිසි ලෙස බැහැර කිරීම සම්බන්ධව දැනුවත් කිරීම.
5. පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය අවම කිරීම.
6. ජනනය වන ස්ථානයේදීම අපද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් එකතු කිරීම
7. අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීම.



## අරමුණු

- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ හරිත විශ්වවිද්‍යාල සංකල්පය දිරි ගැන්වීම.
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ඵලදායී ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රජාව අපද්‍රව්‍ය ජනනය අවම කිරීම පිළිබඳ දැනුවත් කිරීම.
- ප්‍රතිචක්‍රීකරණය හා නැවත භාවිතා කිරීම පිළිබඳ විශ්ව විද්‍යාල ප්‍රජාව දැනුවත් කිරීම.
- අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ යහපත් ආකල්ප ඇති කිරීම.

## ඔබ දන්නවාද ?

- පොලිතීන් යනු ඛනිජ තෙල් පිරිපහදුවෙන් පසු ඉවත් කරන ප්‍රාථමික පෙට්‍රෝ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිශ්පාදනයකි.
- ශ්‍රී ලංකාවේ දිනකට ප්ලාස්ටික් හා පොලිතීන් මෙට්‍රික් ටොන් 400 ක් පමණ නිෂ්පාදනය කෙරෙන අතර ලන්ච්ෂීට් මිලියන 15ක් හා ෂොපින් බෑග් මිලියන 20 ක් දිනකට නිෂ්පාදනය කරයි.
- ශ්‍රී ලංකාව තුළ දිනකට ලන්ච්ෂීට් ලක්ෂ 2 ක් හා පොලිතීන් බෑග් එක් ලක්ෂ පනස්දහසක් පමණ භාවිතයට ගැනේ.
- මයික්‍රො ප්ලාස්ටික් යනු ප්ලාස්ටික්වලින් කැඩුණු මිලිමීටර් 5ක් හෝ ඊට කුඩා ප්ලාස්ටික් කැබලි වේ. පානීය ජලයේ හා පරිභෝජනය කරන ආහාරවල මෙන්ම පාවිච්චි කරන දත් බෙහෙත්,රූපලාවණ්‍ය ක්‍රීම්වර්ගවල ද මයික්‍රො ප්ලාස්ටික් අඩංගු වේ.
- සතියක් තුළ ග්‍රෑම් 5 ක පමණ මයික්‍රෝ ප්ලාස්ටික් ප්‍රමාණයක් එනම් ක්‍රෙඩිට් කාඩ් පතෙහි බරට ට සමාන ප්‍රමාණයක් එක් පුද්ගලයෙකු ගේ ශරීරයට එකතු වන බව සමීක්ෂණයකට අනුව සොයා ගෙන තිබේ.
- මයික්‍රො ප්ලාස්ටික්, ක්ෂුද්‍ර ජීවීන් සහ විෂ රසායනික ද්‍රව්‍ය සඳහා වාහකයන් ලෙස ක්‍රියා කරයි.ස්නායු ආබාධ, පිළිකා කාරක බලපෑම්, සාමාන්‍ය හෝමෝන ක්‍රියාකාරිත්වයට බාධා කිරීම් හා භ්‍රෑණ මොළයේ වර්ධනයට මෙන්ම දරුවන්ගේ මොළයේ වර්ධනයට බලපෑම් සිදු කරයි.
- වාර්ෂිකව මිලියනයකට අධික මුහුදු ජීවින් ප්‍රමාණයක් සාගරවල තැන්පත් වන ප්ලාස්ටික් අපද්‍රව්‍ය නිසා මරණයට පත් වේ.

## පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතයෙන් සිදුවන හානි

- භූමි දූෂණය නිසා පාංශු ජීවීන් විනාශ වීම හා පස නිසරු වීම.
- ජල දූෂණය හෙවත් ජලයේ ගුණාත්මකභාවය වෙනස් වීම.
- මිනිස් සෞඛ්‍යයට අහිතකර වීම.
- පරිසර පද්ධතිවලට හානි වීම.
- කසල ආහාරයට ගැනීමෙන් සතුන් විවිධ රෝගාබාධවලට ලක්වී මිය යාම.
- කානු පද්ධති අවහිර වී මදුරුවන් හා මැස්සන් බෝ වීම.

**පොලිතීන්වල අඩංගු බහු ක්ලෝරිනීකෘත බයිෆීනෝල් (Polychlorinated biphenyls (PCBs) සහ බහු චක්‍රීය ඇරෝමැටික හයිඩ්‍රෝකාබන (Polycyclic aromatic hydro-carbons (PAHs) මිනිස් සිරුරට අහිතකරයි.**

### පොලිතීන් දහනයෙන් ඇතිවන රෝගාබාධ

⇒ ශ්වසන ආබාධ
⇒ සමේ රෝග
⇒ ස්නායු දුර්වලතා
⇒ පෙනහලු පිළිකා
⇒ හෘදයාබාධ
⇒ උපත් හා ප්‍රතිශක්තීකරණ සංකූලතා
⇒ මළ දරු උපත්








